**ඇමුණුම 03**

| කාර්යාල ප්‍රයෝජනය සඳහා | |
|---|---|
| ගිවිසුම් පත් අංක | |

## <u>සමෘද්ධි ප්‍රතිලාභ ලැබූ ප්‍රතිලාභීන් (දැනට අස්වැසුම ලබන හෝ නොලබන) නිෂ්පාදන ආදර්ශ ගම්මාන ක්‍රියාත්මක කිරිමේදී සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව හා සහභාගීවන්නා අතර එළඹෙනු ලබන ගිවිසුම</u>

මෙහි පළමු පාර්ශවය යයි කියනු ලබන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 2017 අංක 2 දරන පනතින් සංශෝධිත 2013 අංක 01 දරණ දිවි නැගුම පනත මගින් ස්ථාපිත කරණ ලද 4 වන මහල, සෙත්සිරිපාය , බත්තරමුල්ල යන ස්ථානයෙහි පිහිටි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙනුවෙන් ........................... දිස්ත්‍රික්කයෙහි .................. ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ප්‍රදේශිය ලේකම් හෝ ඔහු විසින් බලය පවරනු ලබන සමෘද්ධි කළමනාකරු එක් පාර්ශවයකට ද,
දෙවන පාර්ශවයැයි කියනු ලබන එම බල ප්‍රදේශයේ ............................................... ( ස්ථිර ලිපිනය ) හි පදිංචි ජා.හැ.ප. අංක ......................................... දරණ ( සම්පූර්ණ නම ) මයා / මිය /මෙනවිය යන අය හා මින් මතු ප්‍රතිලාභියා වශයෙන් හඳුන්වනු ලබන අනෙක් පාර්ශවයටද බැදි දෙපාර්ශවයේ එකගත්වය ඇතිව වර්ෂ 20................. ක් වූ ..................... මස ............ වෙනි දින ඇති කර ගන්නා ලද ගිවිසුමයි.

**එකී ගිවිසුමෙහි කොන්දේසි කවරේද යත්,**

1. ඉහත ගිවිසුම් ප්‍රකාරව ආදර්ශ ගම්මාන වැඩසටහන යටතේ ආදායම් උත්පාදන කටයුතු ප්‍රවර්ධනය කිරිම පිණිස හදුනා ගන්නා ලද (නිෂ්පාදන ආදර්ශ ගම්මානයේ නම ................................ සඳහා එකී ප්‍රතිලාභියා සුදුසු වන හෙයින් පහත දක්වා ඇති නිෂ්පාදන ආදර්ශ ගම්මානයේ ව්‍යාපාරයේ යෙදවුම් මතු දැක්වෙන කොන්දේසි වලට යටත්ව භාරදිමට දෙපාර්ශවය එකගවේ.

2. ඉහත ගිවිසුම් ප්‍රකාරව සමෘද්ධි වැඩසටහන යටතේ උක්ත නිෂ්පාදන ආදර්ශ ගම්මානය ආරම්භ කිරිම වෙනුවෙන් පහත ලේඛනයේ සඳහන් රුපියල් .............................. ක් ( රු................. ) වටිනා ව්‍යාපෘති / යෙදවුම් අද දින ප්‍රතිලාභියා වෙත භාරදුන් බවට දෙපාර්ශවයම එකග වේ.

3. ඉහත ගිවිසුම් ප්‍රකාරව ලබා දෙන ලද නිෂ්පාදන ආදර්ශ ගම්මානය ........................... අඛණ්ඩ ගෙන යන බවට දෙපාර්ශවය එකගවේ.

4. ඉහත ගිවිසුම් ප්‍රකාරව ලබා ගත් එකී යෙදවුම් මෙම නිෂ්පාදන ආදර්ශ ගම්මානය සඳහා පමණක් නිසි ලෙස යොදා ගනිමින් ව්‍යාපාරය සාර්ථකව පවත්වා ගෙන යාමට දෙවන පාර්ශවය බැදී සිටී.

5. ඉහත ගිවිසුම් ප්‍රකාරව නිෂ්පාදන ආදර්ශ ගම්මානය ක්‍රියාත්මක කිරිමේදී ස්වභාවික හානියක් හැර, නොසැලකිලිමත් කම නිසා ව්‍යාපාරයට හානියක් සිදු විමෙන් ව්‍යාපාරය අසාර්ථක වුවහොත් රජය විසින් දරණ ලද මුළු මුදල දෙවන පාර්ශවය විසින් පළමු පාර්ශවයට ගෙවිමට බැදී සිටී.

6. ඉහත ගිවිසුම් ප්‍රකාරව ආරම්භ කරන ලද නිෂ්පාදන ආදර්ශ ගම්මානය  යම් හේතුවක් නිසා හානියට පත් වුවහොත් වහාම ඒ බව වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරි හෝ ( ව්‍යාපෘති / මූලස්ථාන ) කළමනාකරු වෙත  සිද්ධිය සිදුවී පැය 24 ක් ඇතුලත ඒබව දැන්වීම කරන බවට දෙවන පාර්ශවය එකගවේ.

7. ඉහත ගිවිසුම ප්‍රකාරව නිෂ්පාදන ආදර්ශ ගම්මානය  අධීක්ෂණය හා පසු විපරම් කිරිම සමෘද්ධි සංවර්ධන නිලධාරියාට / ව්‍යාපෘති කළමනාකරුට හා අදාල අනෙකුත් සහාය සේවා සපයන නිලධාරින්ටත් ඇති බව දෙපාර්ශවය පිළිගනි.

8. මෙම ගිවිසුම අනුව නිෂ්පාදන ආදර්ශ ගම්මානය සම්බන්ධ ඉහත කොන්දේසි උල්ලංඝනය කිරිමෙන් හෝ කඩකිරිමෙන් මෙම දෙපාර්ශවය අතර ඇතිවන ආරවුල් හෝ ගැටළු සහගත තත්වයකදි අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තිරණය අවසාන තිරණය බව දෙපාර්ශවය පිළිගනි.

මිට සාක්ෂි වශයෙන්  පළමු පාර්ශවය සඳහා සමෘද්ධි දෙපාර්තමේන්තුව වෙනුවෙන් ............  ප්‍රාදේශිය ලේකම් හෝ බලය  පවරන ලබන සමෘද්ධි කලමනාකරු සහ දෙවන පාර්භවය වෙනුනේ ව්‍යාපාරිකයා වර්ෂ.......... ක් වූ ....  මස  .... වනි දින ........................... හිදි අත්සන් තබන ලදි.

| | |
|---|---|
| පළමු පාර්ශවය | දෙවන පාර්ශවය |
| අත්සන ........................... | අත්සන .................... |
| මූලස්ථාන / ව්‍යාපෘති කළමනාකරු | ව්‍යාපාරිකයා |
| (නිල මුද්‍රාව ) | ජා. හැ. ප. අංකය. ........................... |
| දිනය : | දිනය : |

පළමු පාර්ශවය වෙනුවෙන් අත්සනට සාක්ෂි

1. අත්සන :
   නම:
   ජා. හැ. ප. අංකය :

පළමු පාර්ශවය වෙනුවෙන් අත්සනට සාක්ෂි

2. අත්සන :
   නම :
   ජා. හැ .ප. අංකය: